## සාමාන්‍ය සමයේ විසිතුන්වන සතිය
## බදාදා

## පළමුවන කියැවීම

ශුද්ධවූ පාවුලු තුමන් විසින් කොලොස්සිවරුන්ට ලියන ලද හසුනෙන් කොටසකි.

කොලොස්සි 3: 1–11

**"ක්‍රිස්තුස් වහන්සේ සමඟ උත්ථාන කරනු ලැබූ බැවින් ලොව්තුරු දේ කෙරෙහි ඔබේ සිත යොමු කරන්න."**

ඔබ ක්‍රිස්තුස් වහන්සේ සමඟ උත්ථාන කරනු ලැබූ බැවින් දෙවියන් වහන්සේගේ දකුණු පස වැඩ හිඳින ක්‍රිස්තුස් වහන්සේ වැඩ සිටින තැන ඇති, ලොව්තුරු දේ ප්‍රාර්ථනා කරන්න. ලෞකික දේ කෙරෙහි නොව, ලොව්තුරු දේ කෙරෙහි ඔබේ සිත යොමු කරන්න. මන්ද, ඔබ මැරුණු බැවින් දැන් ඔබේ ජීවිතය ක්‍රිස්තුස් වහන්සේ සමඟ දෙවියන් වහන්සේ තුළ සැඟවී පවතියි. අපේ ජීවනය වන ක්‍රිස්තුස් වහන්සේ ප්‍රකාශ වන විට, ඔබත් උන් වහන්සේ වන ක්‍රිස්තුස් වහන්සේ සමඟ තේජසින් ප්‍රකාශ වනු ඇත.

එබැවින් කාමමිථ්‍යාචාරය, අපිරිසිදුකම, කාමරාගය, නපුරු තෘෂ්ණා සහ රූප වැඳීමක් වැනි තණ්හාව යන කාමුක දුසිරිත් නසා දමන්න. මේ දේ නිසා අකීකරු වන අය පිට දේව උදහස පැමිණෙනු ඇත. ඔබත් එක් කාලයක දී ඔවුන් මෙන් මේ දුසිරිත්වල ඇලී ගැලී ජීවත් වූවහු ය.

එහෙත් දැන් ඔබ ඒ සියල්ල එනම්, උදහස, කෝපය, කුඩුකේඩුකම, අපවාදය, අසභ්‍ය කතා, මුලිනුපුටා දමන්න. එකිනෙකාට බොරු නොකියන්න. මන්ද, ඔබ පරණ ස්වභාවය එහි දුසිරිත් සමග ඉවත ලා, අලුත් ස්වභාවයකින් සැරසී සිටින්නහු ය. දෙවියන් වහන්සේ පිළිබඳ සම්පූර්ණ දැනගැන්මට ඔබ පමුණුවන පිණිස, ඒ අලුත් ස්වභාවය එහි මැවුම්කාරයාණන්ගේ රූපය අනුව උන් වහන්සේ නිරන්තරයෙන් අලුත් කරන සේක. ඒ අලුත් ජීවිතයෙහි ග්‍රීක ජුදෙව් කියා වත්, චර්මඡේදිත අචර්මඡේදිත කියා වත්, ම්ලේච්ඡ, ශිෂ්ට කියා වත්, දාස නිර්දාස කියා වත් භේදයක් නැත.

ඇත්තේ සියල්ලන් තුළ සියල්ල වන ක්‍රිස්තුස් වහන්සේ පමණෙකි.

දේව වචනය මෙසේ ය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 145 : 2-3, 10-13

පිළිතුර: සමිඳාණෝ සියල්ලන්ට කරුණාවන්ත ය.

ගීය:

සැම දා ඔබට තුති පුදමි. සදාකල් ඔබ නම පසසමි.
සමිඳාණෝ උතුම් ය. උසස් ම පැසසුම් ලැබිය යුතු ය. එතුමන්ගේ උතුම්කම සොයා දැනගත නොහැකි ය.

සමිඳුනි, ඔබ මැවූ සියලු දේ ඔබට තුති පුදයි. ඔබේ සැදැහැවත්තු ද ඔබට ප්‍රශංසා කරති. ඔව්හු ඔබේ රාජ්‍යයේ මහිමය වර්ණනා කරති. ඔබේ බල මහිමය ගැන ද කතා කරති.

එසේ කරන්නේ දෙවිඳුන්ගේ ප්‍රබල ක්‍රියාත්, රාජ්‍යයේ තේජෝ මහිමයත් මිනිසුන්ට දන්වන පිණිස ය.

ඔබේ රාජ්‍යය සදාකාලික ය. ඔබේ ආධිපත්‍යය ද සියලු පරම්පරාවල ම පවත්නේය. සමිඳාණෝ සියලු පොරොන්දු ඉටු කරන සේක. තමන් කරන සියල්ලේ දී මෙත් සිත් වඩන සේක.

## සුපුවත් ජය නද (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
යමෙක් ස්වාමින් වහන්සේගේ දහම පිළිපදින්නේ ද ඒකාන්තයෙන්ම ඔහු තුළ දෙවියන් වහන්සේගේ ප්‍රේමය සම්පූර්ණ වී ඇත.
ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
ප්‍රමෝද වන්න. ප්‍රීතියෙන් නටන්න.
කුමක් නිසාදයත්, ස්වර්ගයෙහි ඔබගේ පල විපාක ඉමහත් වනු ඇත.
ආලේලූයා!

# සුවිශේෂය

ලූක්තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

ලූක් 6: 20–26

**"දිළිඳු වූ ඔබ භාග්‍යවන්තයෝ ය."**

ජේසුස් වහන්සේ සිය ශ්‍රාවකයන් දෙස බලා මෙසේ වදාළ සේක.

"දිළිඳු වූ ඔබ භාග්‍යවන්තයෝ ය.
මන්ද, දෙවියන් වහන්සේගේ රාජ්‍යය ඔබගේ ය.

දැන් සාගිනි ඇති ඔබ භාග්‍යවන්තයෝ ය.
මන්ද, ඔබ තෘප්තිමත් වනු ඇත.

දැන් කඳුළු හෙළන ඔබ භාග්‍යවන්තයෝ ය.
මන්ද, ඔබ සිනාසෙනු වනු ඇත.

දැන් කඳුළු හෙළන ඔබ භාග්‍යවන්තයෝ ය.
මන්ද, ඔබ සිනාසෙනු ඇත.

මනුෂ්‍ය පුත්‍රයාණන් නිසා මිනිසුන් ඔබට වෛර බැඳ, ඔබ ප්‍රතික්ෂේප කොට, ඔබට නින්දා කොට, ඔබේ නාමය හෙළා දකින කල ඔබ භාග්‍යවන්තයෝ ය. ඒ දවස්වලදී ප්‍රමෝද වන්න. ප්‍රීතියෙන් නටන්න. මක්නිසාද යත් ස්වර්ගයෙහි ඔබගේ පල විපාක ඉමහත් වනු ඇත. ඔවුන්ගේ පියවරු දිවැසිවරයන්ට ද එසේම කළහ.

අහෝ, ධනවත් ඔබට වන විපතක මහත!

ඔබේ සැපවත් ජීවිතය විඳ හමාර ය.

අහෝ! දැන් පුෂ්ටිමත්ව සිටින ඔබට වන විපතක මහත!
ඔබට, සාගිනි වනු ඇත.
අහෝ, දැන් සිනාසෙන ඔබට වන විපතක මහත!
ඔබ හඬා වැළපෙනු ඇත.
අහෝ! මිනිසුන් ඔබ පසසන විට ඔබට වන විපතක මහත!
ඔවුන්ගේ පියවරුන් බොරු දිවැසිවරයන්ටත් කළේ එයම ය.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.